දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033 , 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/14/02/2020 - T
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2025.08.
திகதி )
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපිඅංක - 02-132/2025

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර / ගාල්ල
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ශික්ෂණ රෝහල් /
මහ රෝහල් / මූලික රෝහල් හා විශේෂිත ව්‍යාපාර හා ආයතන ප්‍රධානීන් ඇතුලු
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

<u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වෛද්‍ය අධ්‍යාපන) තනතුරට අයදුම්පත් කැඳවීම.</u>

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වෛද්‍ය අධ්‍යාපන) තනතුරට රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන වල සේවය කරන 2025.08.25 දිනට පහත 04 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් ක්‍රමය - මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL-01/2025 (රු.82,150-10X2,400-8X2,940-17X3,900-195,970/-) වැටුප් පරිමාණය හිමි අතර, ඔබට වැටුප් ගෙවනු ලබන්නේ අදාළ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ය.

03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි - මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය / වැන්දඹු අනන්දරු / වැන්දඹු පුරුෂ අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04. අවශ්‍ය සුදුසුකම් -

I. වෛද්‍ය සේවයේ වෛද්‍ය විද්‍යාල්පති / විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී (අධ්‍යාපන) තනතුරක සිටින නිලධාරියෙක් වීම.
II. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 05 තුළ එම තනතුරේ / තනතුරුවල සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01-2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
V. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

05. තෝරා ගන්නා ක්‍රමය

ඉහත 04 හි සුදුසුකම් සහිත නිලධරයන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් ලබන නිලධාරියා තෝරා ගනු ලැබේ. අයදුම්කරුවන් විසින් අදාළ සුදුසුකම් අයදුම්පත් පියවන දිනය වන 2025.08.25 දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| I | | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ සේවා කාලයට | උපරිම ලකුණු 30 |
| | | විශේෂ ශ්‍රේණියේ එක් වසරකට<br>මාස 06 කට<br>මාස 03 කට<br>ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හා 01/ 2019 (1) අනුව සිදු කෙරේ. | ලකුණු 03<br>ලකුණු 02<br>ලකුණු 01 |
| II | | හෙද සේවයේ 1 වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ සේවා කාලයට | උපරිම ලකුණු 30 |
| | | 1 වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ සක්‍රීය සතුටුදායක සේවා කාලය සඳහා වසරකට<br>මාස 06 කට<br>මාස 03 කට | ලකුණු 03<br>ලකුණු 02<br>ලකුණු 01 |
| | | සටහන - ඉහත අංක 04 යටතේ මූලික සුදුසුකම් ලෙස සළකා බලන සේවා කාලය සඳහා 06.I හා 06.II හි දී ලකුණු ලබා දෙනු නොලැබේ. | |
| III | | ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් (සනාථ කිරීම සඳහා සහතික පත්‍ර මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.) | උපරිම ලකුණු 25 |
| | අ | හෙද ක්ෂේත්‍රයට සෘජුවම අදාළ වන අධ්‍යාපන සුදුසුකම් සඳහා | උපරිම ලකුණු 13 |
| | 01 | පශ්චාත් උපාධිය | ලකුණු 13 |
| | 02 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | ලකුණු 11 |
| | 03 | උපාධියක් සඳහා | ලකුණු 09 |
| | 04 | ඩිප්ලෝමා පාඨමාලාවක් (මාස 06 කට හෝ පැය 720 කට නොඅඩු) | ලකුණු 07 |
| | 05 | සහතික පත්‍රයක් (මාස 03කට නොඅඩු) | ලකුණු 05 |
| | | සටහන -<br>I. සේවයට බඳවා ගැනීමට අදාළ කරගත් මූලික අධ්‍යාපන සුදුසුකම සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු නොලැබේ.<br>II. උක්ත අංක 01, 02 හා 03යටතේ සඳහන් සුදුසුකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය/විදේශීය අධ්‍යාපන ආයතනයක් මඟින් ලබා ගත් සුදුසුකම් විය යුතුය .<br>III. උක්ත අංක 04 හා 05 යටතේ සඳහන් සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ අධ්‍යාපන හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් ආයතනයක් මගින් ලබා තිබීම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් විය යුතු ය.<br>ඉහත අංක 01 සිට 05 දක්වා ඇති සුදුසුකම් අතුරින් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | |
| | ආ | වෙනත් අධ්‍යාපන සුදුසුකම් සඳහා | උපරිම ලකුණු12 |
| | 01 | සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ | ලකුණු 03 |
| | 02 | කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ | ලකුණු 03 |
| | 03 | තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ | ලකුණු 03 |
| | 04 | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ | ලකුණු 03 |
| | | සටහන<br>I. ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව ලබා ගෙන ඇති,<br>පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 03<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 2.5<br>උපාධියක් සඳහා - ලකුණු 02<br>ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 01<br>(මාස 06 කට හෝ පැය 720 කට නොඅඩු)<br>සහතික පත්‍රයක් සඳහා - ලකුණු 0.5<br>(මාස 03 කට නොඅඩු)<br>II. ඉහත එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙන අතර වෙනත් අධ්‍යාපන සුදුසුකම් යටතේ ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 12කි.<br>III. ඉහත අංක 06. III ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් යටතේ සටහන් අංක II හා III හි කොන්දේසි මෙහිදී ද අදාළ වේ. | |

| | | | |
|---|---|---|---|
| IV | ක්ෂේත්‍රයට අදාළ වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | | උපරිම ලකුණු 10 |
| | 01 | විෂයානුබද්ධ පර්යේෂණ, නිබන්ධන , ප්‍රකාශන හා පුවත්පත් සඟරා ආදියට සපයන ලද ලිපි | ලකුණු 02 |
| | 02 | පුහුණු වැඩසටහන් මෙහෙයවීම/ සම්බන්ධීකරණය | ලකුණු 02 |
| | 03 | පුහුණු වැඩමුළු/ සම්මන්ත්‍රණ (දේශීය / විදේශීය) සඳහා සහභාගී වීම | ලකුණු 02 |
| | 04 | ප්‍රශංසා ( පොදු 230 B ආකෘතිය අනුව වන ප්‍රශංසා සඳහා පමණක්) | ලකුණු 02 |
| | 05 | සුවිශේෂී සේවා සැපයීම - ස්වභාවික / හදිසි / වසංගත / ත්‍රස්ත විපත් තත්ත්වයන් | ලකුණු 02 |
| | සටහන - <br> I. අදාළ කාලය තුළ නියමිත බලධරයා විසින් නිකුත් කරන ලද විශේෂ ලිපි ඉදිරිපත් කළ යුතුය. <br> II. එක් සහතිකයකට/ලිපියකට/ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් එක් නිර්ණායකයට උපරිම ලකුණු 02 බැගින් වන පරිදි විය යුතු අතර සියලු සුදුසුකම් අදාළ පරිදි සහතික සහ ලිපි ලේඛන මගින් තහවුරු කළ යුතු ය. <br> ඉහත සියලුම ප්‍රකාශන අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පෙර ප්‍රකාශයට පත්කර තිබිය යුතුය. | | |
| V. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | | උපරිම ලකුණු 05 |
| | (කුසලතාවය,නායකත්වය, ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා) | | |
| | | එකතුව | 100 |

07. අයදුම්පත ඉදිරිපත් කළ යුතු පිළිවෙල

මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කර ගත් ඉල්ලුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් 2025.08.25 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

අධ්‍යක්ෂ (පාලන) 01
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

08. මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

09. තවද, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

e

## අයදුම් පත්‍රය

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන) තනතුරට බඳවා ගැනීම

01. මුලකුරු සමඟ නම - .....................................................................................
(පැහැදිලි අකුරින්)

02. ජාතික හැඳුනුම්පත් අංකය - ...................................................................................

03. ලිපිනය

I. කාර්යාලීය - ......................................................................

II. පෞද්ගලික - ......................................................................

04. ජාතිය - ..........................................................................................

05. විවාහක / අවිවාහක යන වග - ......................................................................

06. දුරකථන අංකය -

I. පෞද්ගලික - ..................................... II. රාජකාරි - ..................................................

07. උපන් දිනය - .................................................................................

2025.03.25 දිනට වයස - අවු - ................ මාස - .................. දින - .................

08. අයදුම්කරු / කාරිය දැනට සේවය කරන ආයතනය - ................................................

09 I. හෙද / හෙදි නිලධාරියක් වශයෙන් ප්‍රථම පත්වීම ලැබූ දිනය - ..........................................

II. 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) ලෙස පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුව ලද

කණ්ඩායම ...................... විභාග අංකය ..................... කුසලතා අංකය ...................

III. 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය - ...............................

(පත්වීම් ලිපියේ පිටපතක් අමුණන්න)

IV. හෙද සේවයේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) ලෙස උසස් වූ දිනය - ...................

(වැඩ භාරගත් ලිපියේ පිටපතක් අමුණන්න)

V. එම සේවයේ කඩවීමක් ඇත් ද - ................................................

VI. එසේ නම් නැවත සේවයේ පිහිටුවන ලද දිනය - ................................................

VII. විදුහල්පති තනතුරට උසස් වී තිබේ නම් උසස් වූ දිනය - ........................................

10. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ/හෙද සභාවේ ලියාපදිංචි වී තිබේ ද යන වග - .............................

11. අකාර්යක්ෂමතාවය නිසා මා විශ්‍රාම ගැන්වීමට කටයුතු අරඹා නොමැති බවත් ඊට විරුද්ධව පවත්නා හෝ ඇති වෙතැයි අදහස් කරන විනයානුකූල ක්‍රියාමාර්ගයක් නොමැති බවත් ප්‍රකාශ කරමි.මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බැව් හෙලි වුවහොත් එසේ සාවද්‍ය බව හෙලි වූයේ තෝරා ගැනීමට පෙර නම් නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

| | |
|---|---|
| ........................................ | ..................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

f

12. විෂය භාර කලමනාකරණ සහකාර නිලධාරින් විසින් පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

I. නිලධාරියා / නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු ලබා තිබේද යන වග - ..............................
(වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් කාල සීමාව සඳහන් කරන්න)
a. ප්‍රසූත නිවාඩු වලට අදාළ වැටුප් රහිත නිවාඩු - ........................................
b. අනෙකුත් වැටුප් රහිත නිවාඩු - ....................................................

II. නිලධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ කිසිවක් ඇත් ද යන වග - ..............................
(එසේ තිබේ නම් අදාළ ලිපියේ පිටපතක් අමුණන්න)

III. පහත වර්ෂවල වැටුප් වර්ධක උපයාගෙන තිබේද (ඔව්/නැත ලෙස සඳහන් කරන්න) (වැටුප් වර්ධක නියෝගයන්වල පිටපත් අමුණන්න)

| | |
|---|---|
| 2025 - ........................ | 2022 - .................................. |
| 2024 - ........................ | 2021 - .................................. |
| 2023 - ........................ | 2020 - .................................. |

IV. අනුමත කාර්ය සාධන පටිපාටියට අනුව පහත වර්ෂ වල කාර්ය සාධන මට්ටම (හොඳයි/ ඉතා හොඳයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි ලෙස) සටහන් කරන්න. (අදාළ කරගත් කාර්ය සාධන වාර්තාවල පිටපත් අමුණන්න)

| | |
|---|---|
| 2025 - ........................ | 2022 - .................................. |
| 2024 - ........................ | 2021 - .................................. |
| 2023 - ........................ | 2020 - .................................. |

........................................................................................................ මයා / මිය /මෙයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු හා අංක 01 සිට 11 දක්වා අයදුම්කරු විසින් දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද අංක 12 යටතේ මා විසින් සපයන ලද තොරතුරු ද නිවැරදි බවට සහතික කරමි.

....................................... ..............................................
දිනය විෂයභාර නිලධාරී අත්සන

13. පරිපාලන නිලධාරියා/ රෝහල් ලේකම්ගේ නිර්දේශය

.................................................................... මයා / මිය /මෙය ගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිලධාරියා විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) /හෙද විදුහල්පති තනතුරේ සේවය කරන බවත්, සහතික කරමි.

................................................ ..............................................
දිනය පරිපාලන නිලධාරියා/ රෝහල් ලේකම්
අත්සන හා නිලමුද්‍රාව

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

.................................................................... මයා / මිය /මෙය ගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිලධාරියා විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) /හෙද විදුහල්පති තනතුරේ සේවය කරන බවත්, සහතික කරමි.

............................................ ................................................
දිනය ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව